# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,724/1 — 1966 දෙසැම්බර් 2 වැනි සිකුරාදා — 1966.12.2**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඉ.වා. හා වි.අ. අංක ජේ. 258 (බී. ආර්.).

අ.ආ.කා. අංක. එල්. 91.

1964 රේ අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමෙ (සංශෝධන) පනතේ 6(ඒ) හා 6(බී) වැනි වගන්තිවලින් සංශෝධිත (460 වැනි අධිකාරය වන) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 19 වැනි වගන්තියේ (1) හා (2) වැනි උප වගන්තිවල විධිවිධාන යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල පිළිබඳ ගරු ඇමතිතුමන්ගේ උපදෙස් පිට, අග්‍රාණ්ඩුකාර තුමන් විසින්, පී. ආර්. ගුණසේකර මහතා සහ ඩී. එච්. ද එස්. ගුණවර්ධන මහතා 1966 දෙසැම්බර් 1 වැනි දින සිට අවුරුදු තුනක කාලයක්ද, ටී. පී. පී. ගුණතිලක මහතා 1966 දෙසැම්බර් 14 වැනි දින සිට අවුරුදු තුනක කාලයක් ද නීතිඥ සාමාජිකයින් වශයෙන් සහ ආර්. එස්. ඩබ්ලිව්. සොයිසා සහ එන්. සී. ඊ. කුරේ මහතා 1966 දෙසැම්බර් 1 වැනි දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා තක්සේරු සාමාජිකයින් වශයෙන්ද, එහි සඳහන් වන පරිදි ඇපැල් නඩු විභාගය පිණිසවූ සමාලෝචන මණ්ඩලයට පත් කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි.

1966 දෙසැම්බර් 1 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

12–476

---

අ.ආ.කා. අංකය : ඕ. 453/57.

රුමේනියානු සමාජවාදී සමූහාණ්ඩුව වෙනුවෙන් සුවිශේෂ හා පූර්ණ බලැති තානාපති වශයෙන් ලංකාවේ පෙනී සිටීමට පත් කරනු ලැබූ ඕරල් ආර්ඩිලීනු උතුමාණන් වහන්සේගේ අක්ත පත්‍රය, මහා රාජිණීන් වහන්සේ වෙනුවෙන් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ භාර ගත්හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය.
කොළඹ, 1966 දෙසැම්බර් 2.

12–477

---

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### අංක 31/66 දරණ ආනයන පාලන දැන්වීම

**1966 ප්‍රංශ/ලංකා ණය යටතේ දෙනු ලබන බලපත්‍ර මත ආනයනයන්**

ඉහත සඳහන් ණය යටතේ දෙනු ලබන වෙන් කිරීම් මත ආනයන බලපත්‍ර නිකුත් කිරීමට අදාල ක්‍රියා පරිපාටිය යට දක්වේ :—

(i) ඉහත සඳහන් ණය යටතේ බඩු ආනයනය කරන ආනයනකයින්ට ' 1966 ප්‍රංශ/ලංකා ණය ' යන ශීර්ෂය යටතේ පංගු වෙන් කිරීම් මෙම දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලැබේ.

(ii) එවැනි පංගු වෙන් කිරීම් ලත් ආනයනකයින් ඔවුන්ගේ ප්‍රංශ සැපයුම්කරුවන් සමඟ ගනුදෙනු අරඹා, ගිවිසුම් සම්පූර්ණ කර ගැනීමෙන් පසු, මෙම දෙපාර්තමේන්තුවේ පංගු වෙන් කිරීම් අංකය සඳහන් කර ගිවිසුමේ පිටපත් තුනක් වහාම Banque Francaise du Commerce Exterieur (B.F.C.E.) No. 21, Boulevard Haussmann 9 (e), Paris, France වෙත යැවීමට ප්‍රංශ සැපයුම්කරුවන්ට දැනුම් දිය යුතුයි. ඉන් එක් පිටපතක් B.F.C.E. හි ලිපිගොනුවල රඳවාගෙන අනික Campaigne Francaise d' Assurance Pour le Commerce Exterieur " COFACE " වෙත යවනවා ඇත.

998/1——සාර් ආර් 19447—12,950 (66/12)

(iii) සැපයුම්කරුගේ වත්කම සහ කාර්මික පිළිගැනීම ගැන ඒත්තු ගිය විගස B.F.C.E. විසින් "COFACE" යන ප්‍රංශ බලධරයන්ගේ අනුමැතිය ඉල්ලුම් කළ විට සාමාන්‍යයෙන් දෙනු ලබන රක්ෂණ ඇප දෙනවා ඇත. මෙම ඇප ලත් විගස, මෙම දෙපාර්තමේන්තුවේ පංගු වෙන් කිරීමේ අංකය සහ ගිවිසුම් හැඳින්වීමේ B.F.C.E. අංකයත් සඳහන් කර, ගිවිසුම පිළිගත් බව ගිවිසුමේ පිටපතක් සමඟ B.F.C.E. කොළඹ, ආනයන හා අපනයන පාලකට දැනුම් දෙනු ඇත.

(iv) ඉහත (iii) ඡෙදයේ සඳහන් පරිදි, B.F.C.E. හි නිවේදනය ලැබුණ පසු ආනයන බලපත්‍ර නිකුත් කිරීමට මෙම දෙපාර්තමේන්තුව මඟින් කටයුතු කරනු ලැබේ.

(v) බලපත්‍ර ලත් විගස, ආනයනකයින්, මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව, සියළු බැංකු වෙත නිකුත් කර ඇති විධානයන් අනුව, ආනයනයන් සඳහා ගෙවීම් පිළිබඳ කටයුතු ඇරඹීමට තම බැංකු සමඟ පිළියෙල කළ යුතුයි.

(vi) මෙම ණය යටතේ ආනයනයන් සඳහා වූ සෑම ගිවිසුමකම ප්‍රංශ නීතියේ ව්‍යවහාරය නියම කරමින් ස්විට්සර්ලන්තයේ සූරිච් හි පිහිටි, ඉන්ටර්නැෂනල් චේම්බර් ඔෆ් කොමර්ස් හි රෙගුලාසීන් සඳහන් කරන අදාල අනිවාර්ය නිරවුල් කිරීමේ වගන්තියක් අඩංගු විය යුතුයි.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
ආනයන හා අපනයන පාලක.

1966.12.2 වැනි දින.
කොළඹ 1 දිය

12–488

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි